**ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳදෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එමමූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට  බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ  වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී.මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍යප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.1(අ) ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දළුගම ඊරියවැටිය ප්‍රදේශයෙහි දසසිල් මාතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.මිලියන 67 ක් හා මහනුවර බෞද්ධ කටයුතු කොමසාරිස් නිල නිවස ඉදි කිරීම වෙනුවෙන් දරන ලද රු.මිලියන 12.5 ක් මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ වශයෙන් මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණි. | නොනිමි වැඩ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් ලෙස දැක්විය යුතු වීම. | මෙම ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇත. එම වාර්තා ලබාගත් පසුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් අපහරණය සඳහා නිර්දේශ කරන ලදුව අපහරණය කරනු ලැබූ ලීබඩු උපකරණ, පරිගණක උපකරණ හා කාර්යාල උපකරණ අයිතම 41 ක පිරිවැය හඳුනාගෙන මූල්‍යප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩු කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කරන ලද භාණ්ඩ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කළ යුතු වීම. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් අඩුකිරීමට කටයුතු කර ඇත. |

### 1.6.2 නීති, රීතිහාරෙගුලාසිවලටඅනුකූලනොවීම

| නීති,රීතිහාරෙගුලාසිවලටයොමුව | විගණන නිරීක්ෂණය<br>අනුකූලනොවීම | නිර්දේශය | ගණන්දීමේනිලධාරීගේඅදහස්දැක්වීම |
|---|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති හා අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට අදාලව පවත්නා හා පැවතිය යුතු නිපුණතා අතර පරතරය පියවීම සඳහා කවර ආකාරයේ මානව සම්පත් සංවර්ධනයක් සිදුවිය යුතුදැයි අධ්‍යයනයකර දෙපාර්තමේන්තුවට සුවිශේෂීවූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වීම. | 2018 සිට 2020 දක්වා කාලය සඳහා චක්‍රලේඛය පදනම්කර ගනිමින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කර නොමැති අතර 2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස්කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයන් 12 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන රු.655,795,000 ක් සලසාගෙන තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.99,648,992 ක් හෙවත් සියයට 7 ක සිට සියයට 100 කදක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | වර්ෂයේ අවශ්‍යතාවයක් නිසි පරිදි පුරෝකථනය කර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතු වීම. | අපේක්ෂිත වියදම් ඇති නොවීම, 3/2016 චක්‍රෙල්ඛය පරිදි සිදු කල යුතු සියළුම වැටුප් පරිවර්තන සිදු නොවීම, අයවැය චක්‍රලේඛ 07/2019 අනුව කටයුතු කිරීම හා ඇතැම් වියදම් අමාත්‍යාංශය විසින් දැරීම ආදී කරුණු හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදු විය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව කිසිම හේතුවක් මත ප්‍රතිපාදන මුදල ඉක්මවා | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන සීමාව තුල වියදම් | 2018 වර්ෂයේ දහම් පාසල් පෙළ පොත් මුද්‍රණයට අදාල බිල්පත් 2019 වර්ෂයේ අවසාන කාර්තුවේ |

| | | | |
|---|---|---|---|
| | බැරකම් සඳහා නොබැඳිය යුතු වුවත්, ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 2 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිය වූ රු.1,236,675 ක්ඉක්මවා රු.31,597,422 ක බැරකම්වලට එළඹ තිබුණි. | සඳහා බැඳීම් ඇති කර ගත යුතු වීම. | ලද බැවින් ඒ සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වීමත් 2019 දෙසැම්බර් මාසයේදී පවත්වන ලද දහම් පාසල් සමස්ත ලංකා සිසු නිපුනතා වැඩසටහන සඳහා සේවය කරන ලද ප්‍රාදේශීයව අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ අතිකාල දීමනා වවුචර් පත් ප්‍රමාදවී ලැබීමත් හේතුවෙන් මෙම බැරකම්වලට එළඹීමට සිදු විය. |
| (ආ) | 2019 දෙසැම්බර් 3 දිනැති හා අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍යප්‍රකාශනවල ඇතුළත් බැඳීම් හා බැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතුයි. එසේ වුවද, වැය විෂයයන් 6ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.4,861,593 ක බැරකම් භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශයේ දක්නට නොලැබුණු අතර වැය විෂයයන් 5ක් සඳහා භාණ්ඩාගාර ප්‍රකාශයේ දක්වා තිබූ රු.19,894,148 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. තවද, වැය විෂයයන් 5කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල හා භාණ්ඩාගාර ලේඛනවල දක්වා තිබූ බැරකම්වල රු.32,391,555 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | මූල්‍ය ප්‍රකාශන සකස් කරන කාල සීමාව තුළ බැරකම් පිළිබඳ භාණ්ඩාගාර ලේඛන යාවත්කාලීනකර නොතිබුණු බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් වූ බැරකම් පිළිබඳ නිවැරදි තොරතුරු දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දසසිල් මාතාවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අරමුණින් කැළණිය ඊරියවැටිය ප්‍රදේශයෙහි දසසිල් මාතා මධ්‍යස්ථානයක් හා පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීමේ කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එසේ වුවද, 2020 නොවැම්බර් විගණිත දින වන විට වර්ෂ 9ක් ගතවී ඇතත් එම ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර නොතිබුණි. | ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතුකළ යුතු වීම. | ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 460 වන පරිච්ඡේදය ප්‍රකාරව ඉඩම අත්පත්කර ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත 2011 ඔක්තෝබර් 18 දින යොමුකර ඇත.අත්පත්කර ගැනීමේ කටයුතු කැළණිය ප්‍රාදේශීය ලේකම් මගින් සිදුකරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහත (අ) ඡේදයෙහි සඳහන් දසසිල් මාතා මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ඉදිකළ ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන්කර 2014 අගෝස්තු 15 දින දෙපාර්තමේන්තුවට භාර දී තිබුණු අතර මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍යමූලික අවශ්‍යතා සම්පූර්ණකර දසසිල් මාතා මධ්‍යස්ථානයපිහිටුවීමට අවස්ථාව පැවතියද 2020 නොවැම්බර් වනවිටත් එම අරමුණ ඉටුකර ගෙන නොතිබුණි. මධ්‍යස්ථානය ස්ථාපිත නොකළද උපයෝගී සේවා, ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා සඳහා 2020 අගෝස්තු දක්වා රු.2,919,654ක් වැය කිරීමට සිදුවී තිබුණි. | කඩිනමින් දසසිල් මාතා මධ්‍යස්ථානය හා පුහුණු ආයතනය ස්ථාපිතකර පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතු වීම. | පුහුණු ආයතනය සඳහා වාර්ෂිකව ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත වීම නිසා මෙම මධ්‍යස්ථානය පිහිටුවීමට නොහැකි විය. 2020 වර්ෂයේදී මෙම ආයතනය ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද කොරෝනා තත්ත්වය හේතුවෙන් එය සිදුකළ නොහැකි විය. |
| (ඇ) | දෙපාර්තමේන්තුපරිශ්‍රයෙහි පිහිටි මහල් 2කින් යුත් ගොඩනැඟිල්ල සඳහා 2019 මැයි 30 දින එකතුව රු.642,256ක් වූ වායුසමීකරණ යන්ත්‍ර 3ක් ස්ථාපිතකර තිබුණු නමුත් එම ගොඩනැඟිල්ල සඳහා අවශ්‍ය තෙකලා විදුලි සැපයුම් අවශ්‍යතා සපුරා නොගැනීම හේතුවෙන් එම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයෙහි නොතිබුණි. තවද, එම යන්ත්‍ර සඳහා ලබාදී තිබූ වගකීම් කාලයෙන් වර්ෂ 1 මාස 6ක කාලයක් යන්ත්‍ර උපයෝජනයකින් තොරවම අවසන්වී තිබුණි. | තෙකලා විදුලි පහසුකම් ලබා ගැනීමේ කටයුතු කඩිනම්කළ යුතු වීම සහ අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන කටයුතු කළ යුතු වීම. | විදුලි බල මණ්ඩලය විසින් ඇස්තමේන්තුව එවා ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශය විසින් ඉල්ලා තිබූ බැවින් එම ප්‍රතිපාදනද දෙපාර්තමේන්තුව මඟින් යොමුකර ඇත. |
| (ඈ) | භික්ෂූන් වහන්සේලාගේ හා දසසිල් මාතාවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම, දහම් පාසල් සඳහා ආධාර ලබාදීම හා බෞද්ධ දරු දැරියන්ට සහන සැලසීමආදී අරමුණු ඉටු කිරීම සඳහා ස්ථාපිත බුද්ධශාසන භාරයෙහි හා දසසිල් මාතා භාරයෙහි2012 සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ලද ආයෝජන පොළී ආදායමෙන් පිළිවෙලින් රු.716,740 ක් හා රු.367,782 ක් අරමුණු ඉටු කිරීම සඳහා යෙදවීමේ හැකියාව පැවතියද ඒ සඳහා කටයුතුකර නොතිබුණි | භාරයන් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් භාර අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | බොහෝ භාර අරමුණු වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික අයවැයෙන් ලබාදෙන මුදල් ප්‍රමාණවත් බැවින් එම භාර අරමුණු බොහෝමයක් වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලින් ඉටුකර ගනු ලබන හෙයින් භාරයේ පොළී මුදලින් එම කටයුතු සිදුකර නොමැත. |
| (ඉ) | දහම් පාසල්වල අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ස්ථාපිත දහම් පාසල් භාරයෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.446,517ක ආදායම් අතිරික්තයක් දසිසු නිපුණතා වැය විෂයය යටතේ රු.344,248ක ප්‍රතිපාදන ඉතිරියක් පැවතුණි. එසේවුවද, | භාරය පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් භාරයේ අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | ඉතිරි අරමුදල් 2020 වර්ෂයේදී දහම් පාසල්වල අභිවෘද්ධිය සඳහා යෙදවීමට කටයුතු කරනු ලැබේ. |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඌන සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා නිර්දේශ වූදහම් පාසල් 102ක් සඳහා ප්‍රතිපාදන ලබදීමට නොහැකිවී තිබුණි.එබැවින් අමාත්‍යාංශය සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් භාරයෙහි ආදායම ඌන සංවර්ධිත දහම් පාසල්වල අභිවෘද්ධිය වෙනුවෙන් යෙදවීමට අවස්ථාව පැවතියද ඒ සඳහා කටයුතුකර නොතිබුණි.